# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ජනක රොෂාන් රණසිංහ
ජයමාවත,
දිවුල්ලැව
ගල්ගමුව

අභියාචක

අභියාචනා අංකය :
RTIC/Appeal/808/2023

එදිරිව

ශ්‍රී ලංකා විවෘත
විශ්වවිද්‍යාලය
තැ.පෙ 21
නාවල
නුගේගොඩ

පොදු අධිකාරිය

ඉදිරිපිටදී :

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම්. නහියා - කොමසාරිස්

පෙනී සිටීම : අභියාචක සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් තොරතුරු නිලධාරි / නියෝජ්‍ය ලේඛකාධිකාරි (නීති) ආර්.එල්.ඩබ් රාජපක්ෂ මිය පෙනී සිටී.

ලිඛිත සැළකිරීම් :

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

විභාග කළ දිනය : 2023.11.09

තීරණය කළ දිනය : 2023.11.09



Right to Information Commission

CamScanner

## <u>කොමිෂන් සභාවේ තීරණය</u>

### අභියාචනයට පසුබිම් වූ කරුණු

අභියාචක විසින් 2023/06/21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

> *" 2022/2023 නීති ප්‍රවේශ විභාගයේ සිංහල විෂයට අදාල ලකුණු හා පිළිතුරු පත්‍රයේ පිටපතක් ලබා ගැනීම. (විභාග අංකය 538081) "*

2023/07/10 දිනැතිව ලිපියක් තොරතුරු නිලධාරි විසින් උක්ත තොරතුරු ඉල්ලීමේ සඳහන් එම විෂයට අදාල පිළිතුරු පත්‍රයේ පිටපත් නිකුත් කිරීම 5(1) (ඕ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කර ඇත.

එම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2023/07/11 දිනැතිව නම් කළ නිළධාරිට අභියාචනයක් යොමු කර ඇත. 2023/07/11 දිනැතිව ලිපියක් මගින් නම් කළ නිලධාරි විසින් උක්ත තොරතුරු ඉල්ලීම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) (ඕ) උපවගන්තියේ විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයක් මගින් රහසිගතව තබාගැනීමට නියමිතව ඇති තොරතුරක් වන එම ලේඛනය ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.

එම ප්‍රතිචාරයෙන්ද අතෘප්තියට පත් අභියාචක 2023/07/26 දිනැතිව මෙම කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කර ඇත.

2023.10.07 දිනැති කාර්යාල කාර්ය සටහන අංක 1 අනුව විද්‍යුත් තැපැල මගින් දෙපාර්ශවයටම නොතීසි නිකුත් කර ඇත.

### සළකා බැලීම

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට තොරතුරු මුදා හැරීම පොදු අධිකාරිය විසින් 2016 අංක 12 දරණ පනතේ 5 (1) (ඕ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අද දින පරීක්ෂණයේදී පොදු අධිකාරිය වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි නියෝජ්‍ය ලේඛකාධිකාරි (නීති) / තොරතුරු නිලධාරි ආර්.එල්.ඩබ් රාජපක්ෂ මහත්මිය, පොදු අධිකාරියේ පාලක සභාව විසින් සම්මත කළායැයි කියන අනු ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරමින් කරුණු දක්වන ලදී. ඇය සඳහන් කළ අන්දමට 2016 අංක 12 දරණ පනතේ 5 (1) (ඕ) වගන්තියට අනුරූපව පාලක සභාව විසින් එකී අනු ව්‍යවස්ථාව අනුමත කරමින් අභියාචක විසින් ඉල්ලා ඇති ආකාරයේ තොරතුරු 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන අනුව මුදා නොහැරිය යුතු බවට තීරණය කර ඇති බවයි. මෙවැනි තීරණයක් මගින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන අභිබවා යන සේ පැනවීමේ බලයක් පොදු අධිකාරියේ පාලක මණ්ඩලය සතුව නොමැත. එම බලය ඇත්තේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට බව පොදු අධිකාරිය දැනගත යුතුය.

ඉල්ලා ඇති තොරතුරු මුදා හැරීම පිළිබඳව පනතේ 5 (1) (ඕ) වගන්තියේ විධිවිධාන අදාළ කර ගත නොහැක්කේ එකී ලේඛනයේ නිර්මාතෘ හා කතුවරයා වන්නේ එකී ලේඛනය නිර්මාණය කළ අපේක්ෂකයා වන බැවිනි. එබැවින් අදාළ විභාගය අවසන් වීමෙන් පසුව ලකුණු ප්‍රකාශයට පත් කර පාඨමාලාවද පටන් ගැනීමෙන් පසුව ඉල්ලා ඇති තොරතුරු (අපේක්ෂකයාගේ පිළිතුරු ප්‍රකාශය) මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීමට 5 (1) (ඕ) වගන්තිය අදාළ කර ගැනීමට නොහැක.

එබැවින් ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලු තොරතුරු (ලකුණු හා පිළිතුරු ප්‍රකාශයේ පිටපතක්) 2023.11.21 වන දිනට ප්‍රථම අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරියේ ප්‍රධානී, නම් කළ නිලධාරි, උප කුලපති, මහාචාර්ය පී.එම්.සී



Right to Information Commission

CamScanner

තිලකරත්න මහතා සහ එහි තොරතුරු නිලධාරි, නියෝජ්‍ය ලේඛකාධිකාරි (නීති) ආර්.එල්.ඩබ් රාජපක්ෂ මහත්මිය විසින් ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූල වීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවකදී 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වන වගන්තියේ විධිවිධාන පරිදි පොදු අධිකාරියට සහ එහි තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට සහ ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරමු.

එසේම, "2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)" රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.

..............................................

විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික)- සභාපති

P. R. Walgama ..............................................

විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්

..............................................

නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

..............................................

නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

..............................................

ඒ.එම්. නහියා - කොමසාරිස්



Right to Information Commission

CamScanner